# සත්තරසමො පාඨො

# මහාවංසය

## පාලි වංස කථා

'වංස' යනු උණ ගසට නමකි. පුරුකෙන් පුරුක සම්බන්ධවී ඇති නිසා එම නම භාවිත කරන බව දක්වේ. පසුව කුලය, පරම්පරාව දක්වීම සඳහා ද යොදා ඇත. ඉතිහාස කෘති වංසකථා ලෙස හඳුන්වනුයේ ජාතියක හෝ යම් වස්තුවක අඛණ්ඩ සම්බන්ධතාව දක්වන නිසා ය.

පාලි වංසකථාවන්හි ආරම්භක කෘතිය ලෙස සැලකෙනුයේ **බුද්ධවංසයයි.** එය ත්‍රිපිටකයේ ඛුද්දක නිකායට අයත් 14වන කෘතියයි. '**අනාගතවංස** ' නම් පාලි වංසකථාව පශ්චාත් පේටක කෘතියක් වශයෙන් සැලකේ. ගාථා 142කින් යුතු මෙහි මෛත්‍රී බුදුරදුන්ගේ පහළවීම පිළිබඳ තොරතුරු දක්වේ. **දීපවංසය** අටුවා යුගයට පෙර ලියනලද වංසකථාවකි. ලංකා රාජ්‍යය හා සාසනික ඉතිහාසය මෙහි ඇතුළත් ය. කර්තෘවරයා පිළිබඳ තොරතුරු සඳහන් නොවන දීපවංසයේ ගාථා 1350 කි. මහසෙන් රාජ්‍ය සමය දක්වා තොරතුරු ඇතුළත්ය. මහාප්‍රජාපතී ගෝතමියගේ සිට මහසෙන් රාජ්‍යය දක්වා භික්ෂුණී පරම්පරාව පිළිබඳව ද දීපවංසයේ තොරතුරු ඇතුළත් වෙයි. **දීපවංසයේ ද්විතීයභාගය** ගාථා 2805කින් යුක්ත කොට ක්‍රි.ව. 1839 දී **අහුන්ගල්ලේ විමලකිත්ති තිස්ස** නාහිමියන් විසින් සම්පාදනය කර ඇත.

පාලි වංසකථා අතර **බෝධිවංසය** නම් කෘතිය වැදගත් වන්නේ ගද්‍ය කාව්‍යයක ස්වරූපයෙන් ලියන ලද එකම පාලි ග්‍රන්ථය වන නිසා ය. පරිච්ඡේද 12කින් යුක්ත බෝධිවංසය **දාඨානාග** තෙරුන්ගේ ආරාධනයෙන් **උපතිස්ස** නම් තෙර කෙනෙකුන් විසින් විරචිත ය. ජය ශ්‍රී මහා බෝධියේ දක්ෂිණ ශාඛාවේ ඉතිහාසය ඇතුළත් මෙහි බුද්ධත්වය, ලංකා ගමනය, සංගායනා ආදී තොරතුරු ද ඇතුළත් ය. සංස්කෘත ගද්‍ය කාව්‍යයන්හි ආභාසය ලැබ රචිත වූ කෘතියක් සේ පෙනෙයි.

පාලි ථූපවංසය නම් කෘතිය **මහින්දසේන** පිරිවෙන්වාසී තෙර කෙනෙකුන්ගේ ආරාධනයෙන් පොළොන්නරු යුගයේ විසූ **වාචිස්සර** පිළිබඳව මෙන්ම මහා ස්වාමීන් විසින් රචනා කරන ලදී. රුවන්වැලි සෑය පිළිබඳ ඉතිහාසය දක්වීම අරමුණු කොට රචනා කරන ලද මෙහි බුද්ධ චරිතය, අශෝක රජුගේ 84000ක් වෙහෙර විහාර ද ථූපාරාමය ඉදිකිරීම, ගැමුණු කුමරු හා දසමහා යෝධයන් පිළිබඳ තොරතුරු ද ඇතුළත් වෙයි. ගද්‍ය පද්‍ය මිශ්‍ර කෘතියකි.

**දාඨාවංසය** බුදුරදුන්ගේ වම් දළදා වහන්සේ පිළිබඳ ඓතිහාසික වෘත්තාන්තය

අප වෙත ගෙන එන කෘතියයි. ලීලාවතී රැජිනගේ කාලයේ විසූ පරාක්‍රම සෙන්පතියාගේ ආරාධනයෙන් ශාරිපුත්‍ර සංඝරාජයන්ගේ ශිෂ්‍ය **රාජගුරු ධර්මකීර්ති** මාහිමියන් විසින් රචිත මෙහි ඇතුළත් සංඛ්‍යාව පහකි. ගාථා 415කි. බුද්ධචරිතය, පරිනිර්වාණය, ධාතු බෙදීම, දළදා වහන්සේට පැමිණි උපද්‍රව හා ප්‍රාතිහාර්ය ලක්දිවට දළදා වහන්සේ වැඩමවීම පිළිබඳ පුවත් පද්‍යයෙන් දක්වා ඇති උසස් කාව්‍ය ලක්ෂණ සහිත පාලි කෘතියකි.

**ඡකෙසධාතුවංසය** කර්තෘ අවිනිශ්චිත කුඩා පාලි ගද්‍ය කෘතියකි. අනුරුද්ධ සෝභිත ආදී තෙරවරු හයනමක් කේසධාතූන් හයනමක් ලබාගෙන අනුග්‍රාහකයින් හය දෙනෙකුගේ උත්සාහයෙන් ස්ථාන හයක චෛත්‍ය හයක් තැනූව පුවතක් මෙහි විස්තර වෙයි. දුටුගැමුණු රාජ සමයෙහි ලියන ලදැයි සැලකෙන **ලලාටධාතුවංසය** බුදුරදුන්ගේ ලලාට ධාතුව පිළිබඳ ඓතිහාසික පුවත ඇතුළත් කෘතියයි. රෝහණ ප්‍රදේශයේ ඓතිහාසික තොරතුරු රාශියක් මෙහි ඇතුළත් වෙයි.

අනෝමදර්ශි සංඝරාජයන්ගේ ආරාධනයෙන් කිසියම් තෙර කෙනෙකුන් විසින් රචිත **හත්ථවනගල්ලවිහාරවංස** නම් කෘතිය පාලි චම්පු කාව්‍යයකි. සිරිසංඝබෝධි රජුගේ චරිතය අන්තර්ගත මෙය සංස්කෘත සාහිත්‍යයෙහි ආභාසය ලැබ රචනා කරන ලද කාව්‍ය ග්‍රන්ථයකි. මෙම ඓතිහාසික වංසකථාවලට අමතරව පාලි වංසකථා සාහිත්‍යයේ නූතන තෙරවරුන් විසින් රචිත කෘති කීපයක් ද වෙයි. ඒ අතර වැලිතර අම්බරුක්ඛාරාමාධිපති **අරියවංසාලංකාර විමලතිස්ස** නාහිමියන්ගේ ගාථා 1660න් යුතු **සාසනවංසදීප** නම් කාව්‍යයත් **විදුරුපොල** පියතිස්ස නාහිමිගේ පරිච්ඡේද 4කින් යුතු **අභිනවසාසනවංස** නම් කාව්‍යයත් වැදගත්වේ. පාලි ගද්‍ය පද්‍ය භාෂාවේ ස්වරූපය දැන ගැනීමටත් බොහෝ නිලීන ඓතිහාසික පුවත් දැන ගැනීමටත් වෙනත් ඓතිහාසික තොරතුරු තහවුරු කර ගැනීමටත් පාලි වංසකථා මහෝපකාරී වෙයි.

## මහාවංසය

### ග්‍රන්ථ නාමය

ගුණයෙන් මහත් වූ සම්බුද්ධ, පච්චේකබුද්ධ, ශ්‍රාවක සංඝයාගේ පරම්පරාව හෝ මහාසම්මතාදී රජදරුවන්ගේ පරම්පරාව මහාවංස නම් වේ. සිංහල ජාතියේ උදාරත්වය පෙන්වන ඉතිහාසය දක්වෙන ග්‍රන්ථය ද මහාවංශය නම් වේ.

### ග්‍රන්ථ කරණයේ අරමුණු

**පොරාණෙහි කතො පෙසො - අතිවිත්ථාරතො ක්වචි,**
**අතීව ක්වචි සංඛිත්තො - අනෙකපුනරුත්තකො,**

**වජ්ජිතං තෙහි දොසෙහි - සුඛග්ගහණධාරණං,**
**පසාදසංවෙගකරං - සුතිතොච උපාගතං,**

**පසාදජනකෙ ඨානෙ - තථා සංවෙගකාරකෙ,**
**ජනයන්තා පසාදඤ්ච - සංවෙගඤ්ච සුණාථ මෙ.**

යන ආරම්භක ගාථාවලට අනුව මහාවංසය පැරණි ඉතිහාස ග්‍රන්ථ අතුරෙන් ඇතැම් ඒවා විස්තර වැඩි වූ බැවිනුත්, ඇතැම් ඒවා සංක්‍ෂිප්ත බැවිනුත්, පුනරුක්ත බහුල බැවිනුත් ඒවා මගහැරීම, සිංහලයාගේ අවිච්ඡින්න ඉතිහාසය දැක්වීම, ශ්‍රොතෘජන පහන් සංවේගය ඉපදවීම, ජනප්‍රවාදයන්හි පැවති ඉතිහාස ප්‍රවෘත්ති ලියා තැබීම සඳහා යනාදී අරමුණු ඇතිව රචනා කර ඇත.

**මූලාශ්‍රය**

මහාවංසයට ප්‍රධාන වශයෙන් මූලාශ්‍රය වූයේ **සීහලට්ඨකථා මහාවංසය** හා **උත්තර විහාරට්ඨකථා මහාවංසයයි.** මීට අමතරව දීපවංසය මූලාශ්‍රය වූ බව ඕල්ඩන්බර්ග් මහතා පිළිගනී. ඉතිහාස පුවත් ඇතුළත් ලියවිලි හා ජනප්‍රවාද ද මූලාශ්‍රය වූ බව පෙනී යයි.

**කතුවරයා හා කාලය**

මහාවංසය කොටස් කීපයකින් යුක්ත ය. ඒ ඒ කොටස්වල කතුවරු හා ඒ ඒ කතුවරුන් සම්පාදිත කොටස් පහත සඳහන් පරිදි වේ.

ආරම්භයේ සිට 37 පරිච්ඡේදයේ 52 ගාථාව දක්වා කොටස දික්සඳ සෙනවියා පිරිවෙන් වැසි **මහානාම** හිමියන් විසින් සම්පාදිතය.

37 පරිච්ඡේදයේ සිට 79 පරිච්ඡේදය දක්වා මහපරාක්‍රමබාහු රාජ්‍ය කාලයෙන් අවසන් වන කොටස පොළොන්නරු යුගයේ විසූ **ධර්මකීර්ති** මාහිමියන් විසින් සම්පාදිත ය.

80 පරිච්ඡේදයේ සිට iv පැරකුම්බා රජු දක්වා රාජ්‍ය ඉතිහාසය ඇතුළත් කොටස කිසියම් තෙරනමක විසින් සම්පාදිතය.

iv පැරකුම්බා සිට කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ රාජ්‍ය කාලය දක්වා මහනුවර යුගයේ වැඩ විසූ **තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධරක්ඛිත** හිමියන් විසින් සම්පාදිත ය.

ඉංග්‍රීසීන් සිංහල රජු අල්ලා මුළු දිවයිනම අත්කර ගැනීම දක්වා වූ සියවෙනි පරිච්ඡේදය **හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි** හා **බටුවන්තුඩාවේ** පඬිතුමන් විසින් සම්පාදිත ය.

**මහාවංසයේ අන්තර්ගතය (මුල් කොටසේ)**

මහාවංසයේ මුල් කොටසේ අන්තර්ගත වන්නේ සම්බුද්ධාගමනයේ සිට මහසෙන් රාජ්‍ය අවසානය දක්වා ඓතිහාසික හා ආගමික තොරතුරුය. ඒ ඒ පරිච්ඡේද හඳුන්වා ඇති නාමයන්ගෙන් ඒ ඒ පරිච්ඡේදවල ඇතුළත් කරුණු හඳුනාගත හැකි ය.

1 පරිච්ඡේදය - මහියංගනාගමනං
2 පරිච්ඡේදය - මහාසම්මතවංසං
3 පරිච්ඡේදය - පඨමධම්මසංගීති
4 පරිච්ඡේදය - දුතියධම්මසංගීති
5 පරිච්ඡේදය - තතියධම්මසංගීති
6 පරිච්ඡේදය - විජයාගමනං
7 පරිච්ඡේදය - විජයාභිසෙකො
8 පරිච්ඡේදය - පණ්ඩුවාසදෙවාභිසෙකො
9 පරිච්ඡේදය - අභයාභිසෙකො
10 පරිච්ඡේදය - පණ්ඩුකාභයාභිසෙකො
11 පරිච්ඡේදය - දෙවානම්පියතිස්සාභිසෙකො
12 පරිච්ඡේදය - නානාදෙසපසාදො
13 පරිච්ඡේදය - මහින්දාගමනො
14 පරිච්ඡේදය - නගරප්පවෙසනො
15 පරිච්ඡේදය - මහාවිහාරපටිග්ගහනො
16 පරිච්ඡේදය - චෙතියපබ්බතවිහාරපටිග්ගහනො
17 පරිච්ඡේදය - ධාතුආගමනො
18 පරිච්ඡේදය - මහාබොධිග්ගහණො
19 පරිච්ඡේදය - බොධිආගමනො
20 පරිච්ඡේදය - ථෙරපරිනිබ්බානං
21 පරිච්ඡේදය - පඤ්චරාජකො
22 පරිච්ඡේදය - ගාමිණිකුමාරසූති
23 පරිච්ඡේදය - යොධලාභො
24 පරිච්ඡේදය - දෙවභාතිකයුද්ධං
25 පරිච්ඡේදය - දුට්ඨගාමිණිවිජයො
26 පරිච්ඡේදය - මරීචිවට්ටිවිහාරමහො
27 පරිච්ඡේදය - ලොහපාසාදමහො
28 පරිච්ඡේදය - මහාථූපසාධනලාභො
29 පරිච්ඡේදය - ථූපාරම්භො
30 පරිච්ඡේදය - ධාතුගබ්භමහො
31 පරිච්ඡේදය - ධාතුනිධානං
32 පරිච්ඡේදය - තුසිතපුරගමනං
33 පරිච්ඡේදය - දසරාජකො
34 පරිච්ඡේදය - එකාදසරාජදීපකො
35 පරිච්ඡේදය - ද්වාදසරාජකො
36 පරිච්ඡේදය - තයොදසරාජකො
37 පරිච්ඡේදය - පඤ්චරාජකො

ඒ ඒ පරිච්ඡේදයන්හි ඒ ඒ රජවරුන්ගේ දේශපාලනික ආගමික හා ආර්ථික සංවර්ධනයෙහි ලා ක්‍රියාත්මක වූ තොරතුරු අන්තර්ගත වේ. විශේෂයෙන් ආගමික තොරතුරු බහුලව වාර්තා කෙරේ. කාව්‍ය නායකයෙක් සිටීම, ප්‍රතිමල්ලවයෙක් සිටීම, පරිච්ඡේද වෙන්කිරීම, පරිච්ඡේදාවසානයේ වෘත්ත වෙනස් කොට තිබීම, කාව්‍ය නායකයා උත්කර්ෂයෙන් වර්ණනා කර තිබීම වැනි මහාකාව්‍ය ලක්ෂණ මහාවංශයේ අන්තර්ගත වීම නිසා මහාවංශය රඝුවංශය වැනි මහා කාව්‍යයකැයි සමහරු සිතති. එහෙත් මහාවංශය වාර්තා කරන ඉතිහාසය ප්‍රවෘත්ති බොහොමයක් සත්‍ය වශයෙන්ම සිදුවූ ඒවා බැවින් මහාවංසය ඉතිහාස ග්‍රන්ථයක්ම බව බොහෝ දෙනා විසින් පිළිගන්නා ලද කරුණකි. ශ්‍රී ලාංකිකයාගේ අනන්‍යතාව තහවුරු කර ගැනීමට, ඓතිහාසික පුවත්වල කාලවකවානු තීරණය කිරීමට, අභිලේඛනවල එන ප්‍රවෘත්ති තහවුරුකර ගැනීමට, ආගමික තොරතුරු අනාවරණය කර ගැනීමට හා පාලි පද්‍ය භාෂාවේ ස්වරූපය හඳුනා ගැනීමට මහාවංසය මහෝපකාරී වේ.

### මහාවංසයේ 6 පරිච්ඡේදයේ සාරාංශය

පෙර වංග රට වංග නුවර අග මෙහෙසියට දියණියක් උපන්නා ය 'ඈ උපන් දිනයෙහි නිමිත්ත පාඨකයෝ ඇය සිංහයෙකු සමග විවාහ වන බවට අනාවැකි පළ කළහ. අතිශයින් රූමත් ඈ කාමයන්හි ගිජුබව නිසා දෙමාපියන්ගේ පිළිකුලට පත් වූවා ය. දිනක් ඈ වෙස්වලාගෙන වෙළඳ කණ්ඩායමක් සමග යන්නී ලාටරට වනයේදී ඉදිරියට ආ සිංහයෙකු සමග ගුහාවකට ගොස් වාසය කළා ය. සිංහයා සමග විසීමෙන් ඇය **සිංහබාහු** කුමාරයාත්, **සිංහ සීවලී** කුමරියත් යන දරුවන් ලැබුවා ය. සොළොස් වියැති සිංහබාහු කුමාරයා මවගෙන් කරුණු විමසා තොරතුරු දැන සිංහයා අතහැර මිනිස් වාසයට යාමට තීරණය කළේය. දිනක් සිංහයා ගිය පසු මව සහ නැගණිය උරහිසින් ඔසවාගෙන පනස් යොදුන් දුර කතර ගෙවා ගමනට පිළිපන්නේය. ඔවුහු වංගරට පසල් ගමකට පිළිපන්හ. වගුරජුගේ සේනාපති එහි මිනිසුන් කර්මාන්තවල යොදවමින් සිටියේ ඔවුන්ගෙන් තොරතුරු විමසා වනවාසීන් යැයි කී විට වස්ත්‍ර ආදිය දෙවීය. කෑම දුන් කොළ ඔවුන්ගේ පිනින් රන්බඳුන් වූ නිසා විමතියට පත් සේනාපති තවදුරටත් කරුණු විමසා රජ දියණියකැයි දැන තමාගේ මාමාගේ දියණිය බව වටහාගෙන ඔවුන් වංග නගරයට කැඳවාගෙන ගොස් එහි වාසය කරවීය. සිංහයා අවුත් දරුවන් නොදැක දරුවන් සොයමින් ගම් දනවු විනාශ කරන්නට විය. මහජනයා රජුට මෙය දැන්වූ විට රජතුමා ඇතෙකු මත රන්මසු දහසක් තබා සිංහයා මරා එය ලබාගන්නා ලෙස දැන්වීය. කිසිවෙක් ඉදිරිපත් නොවූ නිසා මසු තුන්දහස දක්වා ඉහළ නැංවීය. සිංහබාහු කුමාරයා සිංහයා මැරීමට ඉදිරිපත් වුවත් පළමු හා දෙවන වර මව විසින් ඔහු වළක්වනු ලැබීය. තුන්වන වර මවට නොදන්වා ගොස් සිංහයා මරා රජුට ඉදිරිපත් කිරීමට ගියේ ය. රජතුමා ඒ වන විට මියගොස් දින හතක් ගෙවී තිබිණ. රජුට පුතුන් නොවූ බැවිනුත් මොහුගේ ක්‍රියාව නිසා ප්‍රකට වූ බැවිනුත් රජතුමාගේ මුණුබුරා නිසාත් සිංහබාහු කුමාරයාට රජකම පිරිනැමිණ. සිංහබාහු කුමාරයා එය පිළිගෙන මවගේ ස්වාමියාට රජකම දී සිංහසීවලිව රැගෙන ලාටරට වනයට ගොස් සිංහපුරය නම් නගරයක් සාදා එහි රජකම් කළේ ය.

සිංහබාහු සහ සිංහසීවලී යුවළ නිවුන් දරුවන් සොළොස් වාරයක් ලැබූහ. දරුවන් දෙතිස අතරින් විජය වැඩිමහලු කුමරා විය. යුවරජකම ලැබූ විජය නොපණත් කම් සිදු කළ නිසා අඩක් හිස මුඩුකොට සත්සියයක් පිරිවර සමග නැව් නංවා රටින් පිටුවහල් කළේ ය. මේ නැව සුප්පාරක පටුනට ගොඩ බැස්සත් එහි උපද්‍රව නිසා නැවත නැව් නැගී බුදුරදුන් පිරිනිවන් පාන දවසෙහි තම්බපණ්ණි දිවයිනට ගොඩබටහ.

**අභ්‍යාස**

1. සුදුසු පද යොදා හිස්තැන් පුරවන්න.

i. පාලි වංසකථා සාහිත්‍යයේ ආදිතම වංසකථාව ------------ යි.
ii. ---------------- අටුවා යුගයට පෙර ලියන ලද්දකි.
iii. ------------- මෛත්‍රී බුදුන්ගේ පහළවීම පිළිබඳ තොරතුරු ඇතුළත් වේ.
iv. දීපවංසයේ ප්‍රථමභාගයේ ගාථා ----------------- කි.
v. -------------------- රචනා කිරීමට ආරාධනා කළේ පරාක්‍රම සෙන්පතියාය.

2. මහාවංසය' යන්නෙහි අර්ථය ලියන්න.
3. කතුවරයා මහාවංසය රචනා කිරීමෙන් බලාපොරොත්තු වූ කරුණු මොනවාද?
4. මහාවංසයේ ප්‍රථමභාගයේ අන්තර්ගතය සැකෙවින් දක්වන්න.
5. බුදුරදුන්ගේ ශාරීරික ධාතු වස්තු විෂය කොට රචිත වංසකථා නම් කරන්න.
6. පාලිවංසකථා රචනා කිරීමේ අරමුණු කෙටියෙන් දක්වන්න.
7. මහාවංසයේ ඇතුළත් මහා කාව්‍ය ලක්ෂණ පහක් දක්වන්න.
8. මහාවංසය කාව්‍ය ග්‍රන්ථයකට වඩා ඉතිහාස කෘතියක් බව තහවුරු කෙරෙන හේතු සාධක දෙකක් ලියන්න.
9. මහාවංසයේ 6 පරිච්ඡේදයෙන් උකහා ගතහැකි සාරධර්ම කීපයක් ලියන්න.
10. සිංහබාහු කුමාරයා සිංහ රජුට හීය විදින අවස්ථාවේ සිංහ රජුට ඇතිවෙන්නට ඇතැයි සිතිය හැකි සිතුවිලි උපකල්පනය කොට ලියන්න.